# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,139 — 1960 ජූනි 3 වැනි සිකුරාද — 3.6.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 391 | තොවුපල් ඡේත්ද හා වෙනත් ඡේත්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 394 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 397 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු භාණ්ඩාදිය විකිණීම ... ... | 409 | විවිධ දැන්වීම් — — — | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායඹ සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙසු සැමට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් සෑම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන් ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) එමම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පශු වෛද්‍යවරුන්ගේ තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරුන්ගේ ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරුවලට අයත් වාර්ෂික වැටුප් පහත සඳහන් වේ :—

(i) අධිකාරි පත්‍ර (ඩිප්ලෝමා) හිමි අයට—

විශේෂ පන්තිය—රුපියල් 6,060 පටන්ගෙන වර්ෂයකට රුපියල් 240 බැගින් තුන් වරක් වැඩිවී රුපියල් 6,780 දක්වා ;

පළමුවැනි පන්තිය—රුපියල් 4,800න් පටන් ගෙන වර්ෂය කට රුපියල් 180 බැගින් තුන් වරක් සහ රුපියල් 240 බැගින් දෙවරක් වැඩිවී රුපියල් 5,820 දක්වා ;

දෙවැනි පන්තිය—රුපියල් 1,620න් පටන් ගෙන වර්ෂයකට රුපියල් 120 බැගින් 19 වරක් වැඩිවී සහ රුපියල් 180 බැගින් 4 වරක් වැඩිවී රුපියල් 4,620 දක්වා.

(ii) ලංකා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය උපාධිධාරීන්ට—

රුපියල් 4,080 පටන්ගෙන වර්ෂයකට රු. 360 බැගින් 12 වරක් හා වර්ෂයකට රු. 480 බැගින් 5 වරක් වැඩිවී රු. 10,800 දක්වා වැඩිවේ. රුපියල් 8,400ට ඉහළින් යා හැක්කේ රජය විසින් පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුවය.

(iii) වෙනත් විශ්ව විද්‍යාලවල පශු වෛද්‍ය උපාධිධරයින්ට—

භාණ්ඩාගාරයේ උපදෙස් අනුව වැටුප් ප්‍රමාණය නියම කරනු ලැබේ.

3. **සේවා කොන්දේසි.**—(i) මේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුවන් අවුරුදු 3ක් තුළ ආධුනිකත්වයේ තබනු ලැබේ.

(ii) තෝරාගත් අයදුම්කරුවන් ක්ෂේත්‍ර නිලධාරීන් වශයෙන් රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සහ ඉරිදා දිනවල සේවය කිරීමට බැඳී සිටිය යුතුය. එහෙත් එම දිනවල සේවයට අතිරේක ගාස්තුවක් හෝ නිවාඩුවක් ද දෙනු නොලැබේ.

(iii) තෝරාගත් අයදුම්කරුවන් විසින් පත්වීම ලැබුණු දින සිට අවුරුදු 3ක් ඇතුළතදී සේවයට පත් කොට යවන ප්‍රදේශයේ වැසියන් සමග මනාසේ කථා කිරීමට සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම ව්‍යක්ත භාවයක් ලබාගත යුතුයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම—

(අ) 1960 ජූනි මස 20 වැනි දිනට වයස අවුරුදු 22ට නොඅඩු බවටත්, අවුරුදු 35ට නොවැඩි බවටත් ;

(ආ) පිළිගත් පශු වෛද්‍ය ආයතනයකින් උපාධියක් හෝ අධිකාරි (ඩිප්ලෝමා) පත්‍රයක් හෝ ලද්දකු බවටත් ;

(ඉ) තමා විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (ස. ලු.—බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ) ;

(ආ) ලබාගත් උසස්ම අධ්‍යයන සහතික පත්‍රය හා සුදුසුකම් පිළිබඳ වෙනත් සහතික පත්‍ර ;

(ඉ) තම සුදුසුකම්, චරිතය, මේ පත්වීමට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක පිටපත් (රාජ්‍ය සේවාවෙහි නියුතු අයදුම්කරුවන්ට මේ උප ඡේදය යටතේ සහතික පත්‍ර එවීමට නියම කරනු නොලැබේ).

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළව ඇති රාජ්‍ය සේවාවෙහි තනතුරුවලට කරන පත්වීම් පිළිබඳ පොදු කොන්දේසි බලනු මැනවි.

7. මේ සඳහා ඉදිරිපත් කරන අයදුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙලකොට 1960 ජූනි මස 20 වැනි දිනට හෝ ඊට පෙර, පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට ලැබෙන ලෙස රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. මේ සඳහා විශේෂ අයදුම්පත් නොමැත. කිසිම අයදුම් පතක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට පුද්ගලික වශයෙන් නොඑවිය යුතුය.

ඒ. වී. රිචර්ඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 මැයි මස 23 වැනි දින,
පේරාදෙණියේ දීය.

### පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරුන්ගේ තනතුරට ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. වයස සහ උපන් දිනය (1960 ජූනි 20 වැනිදාට) :————.
4. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.

(ඉ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ සීයාගේ :————.

(ඊ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තනුවන්ගේ :————.
(අයදුම්කරු ලංකාවේ උපන්නෙහි නම් (අ) කොටස සමග (ආ) හෝ (ඉ) සහ (ඊ) කොටස පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ උපන්නේ නැතිනම් (අ) කොටස සමග (ආ) සහ (ඉ) හෝ (ඉ) සහ (ඊ) කොටස පිරවිය යුතුය.)

5. අයදුම්කරු ලියා පදිංචි කිරීමෙන් හෝ පරම්පරාවෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් ද ? :————.
6. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.
7. වෙනත් සුදුසුකම්, ඇති කරන සත්තු ගැන සහ කෘෂිකර්ම ගැන පළපුරුද්ද :————.
8. දැනට කරන රක්ෂාවක් ඇතොත්, ඒ පිළිබඳ විස්තර :————.
9. කලින් කළ රක්ෂාවල් හා ඒ පිළිබඳ විස්තර :————.
10. චරිතය පිළිබඳ සහතික පත්‍ර ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### පුස්තකාලයාධිපති තනතුර

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපති තනතුරක් සඳහා ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

පහත දක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 ජූනි 16 වැනි දින හෝ ඊට ප්‍රථම හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප.**—මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය අවුරුද්දකට රුපියල් 1,320—72—2,688ක් දක්වා වේ.

3. **සේවයේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර වූද, විශ්‍රාම වැටුප් රහිත වූද එකකි. පත්කිරීම කරනුයේ අවුරුදු තුනක පරීක්ෂණ කාල පරිච්ඡේදයකට යටත් කොටය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් සුදුසුකම් තිබෙන බව ඔප්පු කළ යුතුය :—

(1) 1960 ජූනි 16 වැනි දිනට ඔහුගේ වයස අවුරුදු 25කට අඩු නොවිය යුතු අතර අවුරුදු 40කට වැඩි නොවිය යුතුය. (මේ වයස් සීමාවන් රජයේ සේවකයන් සඳහා බලපවත්වනු නොලැබේ.)

(2) විශිෂ්ඨ චරිතයක් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතුයි.

(3) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය ලබා සිටිය යුතුයි.

(4) පුස්තකාල වැඩ කටයුතු පිළිබඳව පස් අවුරුද්දකට අධික කාල සීමාවක පළපුරුද්දක් තිබිය යුතුයි.

**සැළකිය යුතුයි.**—3 යටතේ සඳහන් කරනලද සුදුසුකම් නැතිවුවද සෙසු සුදුසුකම් ඇති රජයේ සේවකයන්ටද ඉල්ලුම් කළ හැක.

5 අයදුම් පත්‍රවලට—

(අ) උප්පැන්න සහතික පත්‍රය ද,

(ආ) උසස්ම අධ්‍යාපන සහතික පත්‍රද,

(ඉ) ළඟදී ලබාගන්නා ලද චරිත සහතික පත්‍ර තුනකද,

පිටපත් අමුණා එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඒ පිළිබඳ වෙනත් ලියකියවිලි කොළඹ 1, සෙනේට් ගොඩනැගිල්ලේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ වෙන කිසිම නිලධාරියකු වෙත පුද්ගලික වශයෙන් ලැබෙන්නට නොසැලැස්විය යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ පළවෙනි කොටසේ දෙවැනි ඡේදයේ මුලම ආණ්ඩුවේ සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධව ප්‍රසිද්ධ කර තිබෙන සාමාන්‍ය කොන්දේසිවලට අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

ටී. ඊ. ගුණරත්න,
වැඩබලන ප්‍රවෘත්ති අධ්‍යක්ෂ.

1960 මැයි 30 වැනි දින,
කොළඹ 1, සෙනෙට් ගොඩනැගිල්ලේ,
ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදීය.

**පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) සථිර ලිපිනය:————.

(3) වයස සහ උපන් දිනය (උප්පැන්න සහතික පත්‍රයක පිට පතක් ඇමිණිය යුතුයි) :————.

(4) ජාතිය:————.

(5) උපත සිදුවූ ස්ථානය—

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ ආතා :————.

(ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

ඉල්ලුම්කරුගේ උපත ලංකාවේදී සිදුවූනි නම්, (අ) ඇතුලුව (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඉල්ලුම්කරුගේ උපත ලංකාවේ දී සිදු නොවිනි නම් (අ) ඇතුලුව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.

(6) විවාහක ද, අවිවාහක ද යන වග :————.

(7) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ද දන්වීමේ පරිදි උවමනා කරන පළපුරුද්ද ද සඳහන් කරනු. (සහතික පත්‍රවල පිට පත් ඇමිණිය යුතුයි) :————.

(8) ඉගෙනීම ලැබූ ස්ථානය හා එයින් අස්වූ දිනය :————.

(9) පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියාව :————.

(10) දැනට කරන රැකියාව (එවැන්නක් තිබේ නම්) :————.

(11) චරිත සහතික පත්‍ර ලබාගත් අයගේ නම් සහ තරාතිරම් (ඒ සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

(12) වෙනත් විශේෂ සුදුසුකම් :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ මා සඳහන් කළ තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

ස්ථානය :————.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සිවිල් නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණය

සිවිල් සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණයක් 1960 ජූලි මස පහත පළවෙන දිනයන්හිදී පැවැත්වේ :—

| | | | |
|---|---|---|---|
| ජූලි 26 වැනි අඟහරුවාද | ... | නීතිය | සිවිල් සේවයේ සහ විදේශ සේවයේ යෙදී සිටින්නන් විසින් මේ දිනවල මෙම විෂයන් ගන්නවා ඇත. |
| ජූලි 27 වැනි බදාදා | ... | නීතිය | |
| ජූලි 28 වැනි බ්‍රහස්පතින්දා | ... | සිංහල, ලිඛිත* | |
| ජූලි 29 වැනි සිකුරාදා | ... | දෙමළ, ලිඛිත | |
| ජූලි 30 වැනි සෙනසුරාදා | ... | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති සහ පාලන රෙකුලාසි; ගණන් තැබීම | |
| අගෝස්තු 1 වැනි සඳුදා | ... | නීතිය (අනෙක් නිලධාරීන් සඳහා) | |
| අගෝස්තු 2 වැනි අඟහරුවාදා | ... | සිංහල (වාචික) | |
| අගෝස්තු 3 වැනි බදාදා | ... | දෙමළ (වාචික) | |

(* මේ කාල සටහන් වෙනස් කිරීමට ඉඩ තිබේ.)

වර්ෂ 1956යේ සැප්තැම්බර් මාසයේ 24 වැනි දිනයට පසු සිවිල් සේවයට බඳවා ගන්නා අය විසින් ගත යුතු ලංකා සිවිල් සේවා ව්‍යවස්ථාවේ 20 වැනි වගන්තිය යටතේ දක්වා ඇති, සිංහල ප්‍රශ්න පත්‍රය පහත දැක්වෙන කොටස් දෙකෙන් සමන්විත වේ :—

(1) භාෂාව සහ රචනය ... පැය 3 යි

(2) පරිවර්තනය ... පැය 3 යි

2. විදේශ සේවයේ ආධුනිකයන්, පොලිස් හමුදාවේ නිලධාරීන්, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කැලෑ දෙපාර්තමේන්තුව, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, රබර් කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුව, ගුවන් සේවා දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන්, සහකාර ආහාර පාලක නිලධාරීන් (තාවකාලික), කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලක නිලධාරීන් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාලන සහකාර නිලධාරීන් සඳහා පැවැත්වෙන විභාගයත්;

රජයේ වැඩ දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, තැපැල් සහ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව, වරාය ඉංජිනේරු තැනගේ දෙපාර්තමේන්තුව (කොළඹ වරාය කොමිෂම), විදුලි කටයුතු දෙපාර්තමේන්තුව, වෙළඳ දෙපාර්තමේන්තුව, කර්මාන්ත දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුව, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා පැවැත් වෙන වාචික පරීක්ෂණයත් එකම දිනයකදී එකම ස්ථානයකදී පැවැත් වේ.

3. පහතින් දැක්වෙන අන්දමට පුල්ස්කැප් පිටු බාගයක පිළියෙල කරගත් අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් එවිය යුතුය.

4. විභාගය පැවැත්වෙන්නේ විභාග කොමසාරිස් තුමන් යටතේ ය. එබැවින් විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති සහ රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් වෙනවා ඇත.

5. ඉල්ලුම්පත්‍ර, දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ගේ මාර්ගයෙන් කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමන් වෙත 1960 ජූනි 27 වැනි දිනට පෙර රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුය.

ප්‍රමාද වී ලැබෙන කවර ඉල්ලුම් පත්‍රයක් වුවද ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

ඇස්. ඇෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1960 මැයි 25 වැනි දින,
මුදල් අමාත්‍යාංශය, කොළඹ.

### අයදුම් පත්‍රය

**ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව**

සිවිල් සේවය, විදේශ සේවය සහ රජයේ අනෙක් සේවයන්හි යෙදී සිටින (වෛද්‍ය සේවයේ යෙදී සිටින්නන් හැර) නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණය—ජනවාරි/අප්‍රේල්/ජූලි/ඔක්තෝබර්, 19—

(නොයෙදෙන වචන කපන්න)

කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමන් වෙත තම දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් රෙජිස්ටර් තැපෑලෙන් යවනු සඳහා ය.

ඉල්ලුම් පත්‍ර බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් කරන්න.

(1) පෙළපත් නම:————.

අනෙක් නම් :————.

(2) තනතුරු :————.

දෙපාර්තමේන්තුව:————.

(3) ලිපිනය (ප්‍රවේශ පත්‍රය එවනු සඳහාය) :————.

(4) ඔබ යෙදී සිටින්නේ සිවිල් සේවයේ ද, විදේශ සේවයේ ද, එසේ නැත්නම් ඔබ අයිති කවර දෙපාර්තමේන්තුවකට ද ? නො එසේ නම් ඔබ වාණිජ අයදුම්කරුවෙක් ද?:————.

(5) විභාග දෙකකට පෙනී සිටීමට ඔබට සිදුවී ඇත්නම් මේ ඇතුළත් වන්නේ පළමු වැන්නටද දෙවැන්නටද?:————.

(6) ඔබ ගන්නා විෂයයන් පැහැදිලි ලෙස සටහන් කරන්න. (ඔබ ගන්නේ ව්‍යවහාර භාෂාවද ලේඛන භාෂාවද නැතහොත් ඒ දෙකමද ?) සිංහල හෝ දෙමළ විෂයයක් වශයෙන් ගන්නා සිවිල් නිලධාරීන් තමන් පෙනී සිටින්නේ පහළ පන්තියේ ප්‍රශ්න පත්‍රයට ද නැත්නම් උසස් පන්තියේ ප්‍රශ්න පත්‍රයට ද යන්න සඳහන් කළ යුතුය:————.

1. ————.

2. ————.

3. ————.

4. ————.

5. ————.

6. ————.

(7) අයදුම්කරුගේ අත්සන සහ දිනය :————.

විභාග කොමසාරිස්තුමන් වෙත ය.
ඉහතින් දැක්වෙන අයදුම් පත්‍රය ඉදිරිපත් කරමි.
ඉහත සඳහන් කරන ලද තොරතුරු ඇතුළත් අපෙක්ෂකයා විභාගය සඳහා සුදුස්සකු බව, මම සහතික කරමි.

————,

දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ අත්සන සහ තනතුර.

දිනය :————.

---

1/23/6/3/ (ජී) II වෙළුම

## 1958 පෙබරවාරි මස පැවැත්වූ මධ්‍ය ලිපිකාර විභාගය

වර්ෂ 1958වේ නොවැම්බර් මස 28 වැනි දින අංකය 11,603, 1959යේ අගෝස්තු මස 14 වැනි දින අංකය 11,832, 1959යේ සැප්තැම්බර් මස 11 වැනි දින අංකය 11,852, 1959යේ දෙසැම්බර් මස 11 වැනි දින අකංය 12,002, 1960වේ පෙබරවාරි මස 26 වැනි දින අංකය 12,665 සහ 1960 මාර්තු 18 වැනි දින අංක 12,087 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පිළිවෙලින් පළ කරන ලද වර්ෂ 1958වේ නොවැම්බර් මස 24 වැනි දින, 1959යේ අගෝස්තු මස 10 වෙනි දින, 1959යේ සැප්තැම්බර් මස 7 වෙනි දින, 1959යේ දෙසැම්බර් මස 3 වැනි දින, 1960වේ පෙබරවාරි මස 19 වැනි දින සහ 1960වේ මාර්තු මස 10 වැනි දින දරණ නිවේදනයන්ට වැඩිමනත් වශයෙනි. වර්ෂ 1958වේ පෙබරවාරි මාසයේ පැවැත්වූ මධ්‍ය ලිපිකාර විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපෙක්ෂකයන් ද තැපැල් ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකරු පන්තියට පත්කිරීමට තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | | ලිපිනය |
|---|---|---|
| ජයවර්ධන, ආර්. ඩී. | ... | උප තැපැල් කායසීලය, මීවන පලාන, හොරණ. |
| තිලකසේන, ඩබ්ලිව්. | ... | 313/6, වේල්ල වීදිය, කොළඹ 11. |
| පෙරේරා, එච්. පී. | ... | වික්‍රමසිංහ තේ කඩය, උග්ගල් බොඩ, කළුතර. |

2. මේ අපෙක්ෂකයන්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව භාර නොගනියි. එහෙත් පුරප්පාඩු ඇති වන විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සියලුම පත්වීම් තුන් අවුරුදු කාලයක ආධුනික තත්ත්වයේ වන අතර, මෙම සේවයේ කොන්දේසිවලට යටත්වනවා ඇත.

3. මේ අපෙක්ෂකයන්ට පෝස්ට් මාස්ටර්-ජනරාල් විසින් ලියා දන්වනු ලැබේ.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 මැයි මස 30 වෙනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය (සිංහල) —1960 වේ ජනවාරි

වර්ෂ 1960 ක් වූ ජනවාරි මස 16 වැනි දින පවත්වනු ලැබූ, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ, වාර්ෂික වේතනය රුපියල් 2,940 ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛක ලේඛිකාවන්, ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි :—

| නම | | දෙපාර්තමේන්තුව | | විෂයයන් |
|---|---|---|---|---|
| අභයරත්න, ඩී. බී. (මෙනෙවිය) | | සෞඛ්‍ය අමාත්‍යංශය | ... | රචනය සහ ලඝු ලේඛනය |
| නන්දදේව, කේ. ඩී. | ... | නියෝජිත මන්ත්‍රණ සභා නායක හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක තැනගේ කාර්යාලය | | ලඝු ලේඛනය |
| පනාගොඩ, ඩී. ජේ. | ... | අධ්‍යාපන | ... | ලඝු ලේඛනය |
| පෙරේරා, එස්. (මහත්මිය) | ... | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ | | ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂක අපේක්ෂිකාවන් සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා ඇත :—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| අභයරත්න, ඩී. බී. (මෙනෙවිය) | ... | සෞඛ්‍ය අමාත්‍යංශය |
| නන්දදේව, කේ. ඩී. | ... | නියෝජිත මන්ත්‍රණ සභා නායක හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක තැනගේ කාර්යාලය |
| පනාගොඩ, ඩී. ජේ. | ... | අධ්‍යාපන |
| පෙරේරා, එස්. (මහත්මිය) | ... | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයන් සහ අපේක්ෂිකාවන් ද, එම පරීක්ෂණයට ඇතුළත්වීමේ සුදුසුකම් මීට කලින් ලබා ඇති අය ද, මීලඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත්වීම සඳහා තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් විභාග කොමසාරිස්වරයා වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් යවන ලද ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක්වූ මැයි මස 30 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (සිංහල) පරීක්ෂණය—1960 වේ ජනවාරි

වර්ෂ 1960 ක් වූ ජනවාරි මස 16 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදි පහත සඳහන් අස්ථිර පත්වීම් ලබා ඇති ලඝු ලේඛකයන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දැනුම් දෙමි :—

| නම | | දෙපාර්තමේන්තුව | | විෂයය |
|---|---|---|---|---|
| ජයවර්ධන, කේ. ජී. | ... | ගුවන් විදුලි සේවා | | ලඝු ලේඛනය |
| දිසානායක, එච්. බී. | ... | අලෙවි කිරීමේ | ... | ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂකයන් පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් දැන් සමර්ථ වී ඇත :—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| ජයවර්ධන, කේ. ජී. | ... | ගුවන් විදුලි සේවා |
| දිසානායක, එච්. බී. | ... | අලෙවි කිරීමේ |

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක්වූ මැයි මස 30 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වෛද්‍ය රසායනාගාර කාර්මිකයන්ගේ විභාගය

වර්ෂ 1960 මැයි මස 13 වැනි දින සහ අංක 12,130 දරන රජයේ ගැසට් පත්‍රයෙහි ඉහත සඳහන් විෂය යටතේ පළවූ නිවේදනය ගැනයි.

එහි 6 වැනි ඡේදය පහත දැක්වෙන පරිදි සදෙස් විය යුතුය :—

6. වර්ෂ 1960 ජූලි මස 16 වැනි සෙනසුරාදා කොළඹ දී පැවැත්වෙන තරඟ විභාගයේ දී ලැබෙන ප්‍රතිඵල අනුව ආධුනිකයන් තෝරාගනු ලැබේ.

සී. පොන්නම්බලම්,
වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1960 මැයි මස 25 වැනිදා,
කොළඹ දීය.

## රජයේ ලලිත කලායතනය

### 1960 මාර්තු මස පැවැත් වූ අවසාන පරීක්ෂණ වලින් සාමාර්ථය ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නාම ලේඛණය

#### ඇඳීම හා පින්තාරු කිරීම පිළිබඳ (දෑවුරුදු) උසස් පන්තිය

| ප්‍රවේශ පත්‍ර අංකය | නම |
|---|---|
| 1303 | ගුණසේකර, පී. ද ඇස්. ඒ. |
| 1595 | සුරේන්ද්‍ර, ඩී. වී. ඩබ්ලිව්. |
| 1313 | පාදුක්ක, ඩී. කේ. |
| 2944 | දයාසිරි සෝමපාල, පී. ඒ. |
| 2943 | ඇල්බට්, ජී. ඇම්. |
| 2945 | විජේකෝන්, ඇල්. ඇන්. බී. |
| 866 | ජයතිස්ස, වයි. පී. |

#### ඌණ සාමාර්ථය ලබා සිට සාමාර්ථය ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්

අයිස්, ඇම්. ඇස්. ඒ.

#### ඇඳීම හා පින්තාරු කිරීම පිළිබඳ සාමාන්‍ය (තුන්අවුරුදු) පන්තිය

| | |
|---|---|
| 2789 | ජයතුංග, ඇස්. |
| 2779 | කරුණාරත්න, ඇම්. පී. |
| 2786 | කන්දසාමි, ඇස්. |
| 2801 | හේමපාල, එච්. පී. ඩී. |
| 2803 | ජෝතිරත්න, එච්. |
| 2825 | කොලොන්නී, ඩී. ටී. අයි. |
| 459 | තෙවරප්පෙරුම, ඩී. ඇල්. |
| 2795 | පියදාස, එච්. ටී. |
| 2797 | ඒකනායක, ඇස්. ඩබ්ලිව්. |
| 2785 | කාරියප්පෙරුම, පී. පී. |
| 2798 | අබේවර්ධන, කේ. ජී. |
| 2184 | ද සිල්වා, ඒ. ආර්. |
| 2790 | ඩීන්, ඇන්. ඇන්. |
| 2787 | තෙන්නකෝන්, ඇස්. |
| 2806 | වීරතුංග, ඇස්. බී. |
| 1947 | රාජසිංහ, ටී. ඇම්. පී. |

#### මූර්ති ශිල්පය පිළිබඳ (දෑවුරුදු) උසස් පන්තිය

| | |
|---|---|
| 745 | ගුණසේන, ඩබ්ලිව්. එච්. |
| 1363 | බාලසූරිය, ඩබ්ලිව්. ඊ. ජී. |
| 2983 | හේමරත්න, ඩබ්ලිව්. ඇල්. බී. |

#### කොහු කර්මාන්තය පිළිබඳ (තුන්අවුරුදු) පන්තිය

| | |
|---|---|
| 2793 | පෙරේරා, ජේ. පී. |
| 2918 | ප්‍රේමතිලක, ඊ. ඒ. |
| 2919 | ජිනසීලි, පී. කේ. |
| 2989 | සීලවතී, ඇම්. පී. |
| 2991 | ඇන්ටියා, අයි. පී. |
| 3054 | සීලවතී, ආර්. ඇම්. |

#### මැටි කර්මාන්තය පිළිබඳ (තුන්අවුරුදු) පන්තිය

| | |
|---|---|
| 2107 | මර්තිනු, ටී. (1 වැනි පෙළ) |
| 3062 | පෙරේරා, ඇෆ්. ඇම්. |
| 1163 | ධනවතී, ඇන්. ටී. ඩී. |

#### වේවැල් කර්මාන්තය පිළිබඳ (තුන් අවුරුදු) පන්තිය

| | |
|---|---|
| 2988 | විජේරාම, ඩබ්ලිව්. |
| 1454 | පෙරේරා, ඇම්. ජී. |
| 2800 | ඇලෝසියුස්, ඒ. ඒ. |
| 2888 | මොහොට්ටි, ඒ. ඊ. |

#### පිත්තල වැඩ පිළිබඳ (තුන් අවුරුදු) පන්තිය

| | |
|---|---|
| 1531 | දේවනාරායන, ඇම්. ඩබ්ලිව්. ජී. |
| 1435 | පෙරේරා, කේ. සී. |

#### ලාක්ෂා කර්මාන්තය පිළිබඳ (තුන් අවුරුදු) පන්තිය

| | |
|---|---|
| 2880 | සතාසිවම් පිල්ලේ, ටී. |
| 2986 | ගුණරත් එතනා, ඩබ්ලිව්. ජී. — (1 වැනි පෙළ) |
| 2996 | නවරත්න බණ්ඩා, ඩබ්ලිව්. ඇම්. — ( එම ) |
| 2992 | කිරිබණ්ඩා, කේ. ඇම්. — ( එම ) |
| 2997 | උක්කුබණ්ඩා, ඇන්. ඩබ්ලිව්. ඇම්. — ( එම ) |
| 1434 | පෙරේරා, කේ. ඊ. |
| 1549 | පෙරේරා, කේ. පී. |

#### පේෂ කර්මාන්තය පිළිබඳ (තුන් අවුරුදු) පන්තිය

| ප්‍රවේශ පත්‍ර අංකය | නම |
|---|---|
| 3020 | රණසිංහ, සී. |
| 3024 | ප්‍රේමවතී, ඩබ්ලිව්. වී. |
| 3025 | ප්‍රේමවතී, ඇස්. ඇම්. |
| 3019 | පොඩිමැණිකෙ, ඒ. කේ. |
| 3001 | සමරනායක, ඇස්. ඇන්. |
| 3018 | සෝමලතා, ඇස්. පී. |
| 3026 | ආර්ලිස්හාමි, ඇන්. ඒ. |
| 3008 | ඇල්බට්, ඒ. පී. |
| 3012 | මැදිවක, ඇස්. ඒ. |
| 3005 | අත්තනායක, කේ. |
| 2999 | කිරිබණ්ඩා, ටී. ඇම්. |
| 3003 | බබානෝනා, පී. |
| 3013 | මරියනෝනා, ඒ. ඒ. |
| 3002 | කුමාරිහාමි, ඊ. ඇම්. කේ. |
| 3021 | දයාවතී, ඇම්. ඩී. |
| 3041 | විමලාවතී, ඇස්. ඇම්. |
| 3049 | යසවතී, කේ. ඒ. |
| 3052 | මාලනී, ඇම්. |
| 3061 | පුංචිනෝනා, ජේ. ඒ. |
| 3108 | වංශවතී, ඩබ්ලිව්. ඒ. |
| 2998 | මුතුබණ්ඩා, ඇන්. කේ. බී. |
| 3313 | පොඩිනෝනා, ඇම්. |
| 2176 | එමිතනෝනා, ඇම්. ඩී. |
| 2175 | ලියනගේ, ඩී. ඒ. |
| 3295 | ප්‍රේමසීලි, කේ. ඇස්. |
| 2856 | රූපසිංහ, ඇල්. ඇස්. |
| 2869 | තිසේරා, ඩබ්ලිව්. ඒ. |
| 2850 | විමලාවතී, ඇස්. ඩී. |
| 2872 | සාදි අම්මා, ආර්. ඇම්. |
| 2855 | ගුණසේකර, බී. ඩබ්ලිව්. |
| 3011 | විමලාවතී, එච්. ඩී. |
| 2847 | සීලවතී, කේ. ඩබ්ලිව්. |
| 2923 | ඩිංගිරිමැණිකේ, ඇන්. කේ. බී. |
| 2859 | කරුණාරත්න, ඒ. ඇම්. |
| 2877 | සාදිබණ්ඩා, ආර්. ඒ. |
| 2855 | චන්ද්‍රවතී, ඩබ්ලිව්. |
| 2858 | පොඩිමැණිකේ, කේ. ඇම්. |
| 2871 | නන්දවතී, කේ. ඒ. |
| 3017 | ගුණසේකර, ඇන්. ඩබ්ලිව්. |
| 3007 | නන්දවතී, ඇස්. ඒ. ඩී. |
| 3006 | ආරියවතී, ඇම්. ඒ. |
| 3004 | ඩිංගිරිබණ්ඩා, ඩබ්ලිව්. ඇම්. ටී. |
| 3000 | නානායක්කාර, ඩී. අයි. |
| 3014 | කරුණාවතී, එච්. ඒ. |
| 2851 | රූපසිංහ, අයි. ඇස්. |
| 2860 | හීන්බණ්ඩා, එච්. ඇම්. |
| 2874 | සෝමාවතී, බී. ආර්. |
| 3050 | සුබාවතී, එච්. ඒ. |
| 3055 | රොස්ලින් නෝනා, ආර්. ඒ. |
| 3053 | ලීලාවතී, එච්. |
| 2395 | ඇස්ලින් නෝනා, ඇම්. ඒ. |
| 3260 | රත්නායක, පී. එච්. |
| 3261 | සෝමාවතී, කේ. ටී. ඩී. |
| 3028 | නන්දවතී, ජී. |

#### ඌණ සාමාර්ථය ලත් ශිෂ්‍ය. ශිෂ්‍යාවන්ගේ නම් හා අසමත් වූ විෂයයන්

3027 සිලින්හාමි, කේ. ඩබ්ලිව්.
1. මෝස්තර හා මෝස්තර නිර්මාණය.
2. යන්ත්‍ර සටහන් ඇඳීම.

3048 ජේන් නෝනා, බී.
1. මෝස්තර හා මෝස්තර නිර්මාණය.
2. යන්ත්‍ර සටහන් ඇඳීම.

3102 කරුණාවතී, ඩබ්ලිව්. ඒ. ඇල්.
1. යන්ත්‍ර සටහන් ඇඳීම.
2. පේෂ ගණිතය.

3016 සීලවතී, කේ. ඩබ්ලිව්.
1. මෝස්තර හා මෝස්තර නිර්මාණය.
2. යන්ත්‍ර සටහන් ඇඳීම.

2270 කොඩිතුවක්කු, කේ.
1. යන්ත්‍ර සටහන් ඇඳීම.
2. පාටකිරීම, කැඳදැමීම හා සුදුකිරීමේ අභ්‍යාස.

2936 කුමාරිහාමි, ඩබ්ලිව්. ජී.
1. මෝස්තර හා මෝස්තර නිර්මාණය.

#### උතුරු ඉන්දිය සංගීතය පිළිබඳ හයඅවුරුදු (ගායනය) පන්තියේ මධ්‍යම පරීක්ෂණය

| | |
|---|---|
| 2293 | චන්ද්‍රසේන, ටී. එච්. ඩී. |
| 2371 | විජේසිංහ, ටී. පී. |
| 2320 | සොයිසා, කේ. එච්. |
| 2311 | පෙරේරා, ඇස්. |
| 2310 | පෙරේරා, ඇම්. |
| 1689 | කහඳවආරච්චි, පී. |
| 602 | සිල්වා, පී. |

| ප්‍ර. පත්‍ර අංකය | නම |
|---|---|
| 1816 | රුද්‍රිගු, එච්. ඩී. |
| 2362 | විමලාවතී, ආර්. |
| 1551 | කුරේ, බී. ඩබ්ලිව්. |

උතුරු ඉන්දීය සංගීතය පිළිබඳ හයඅවුරුදු (ගායනය) පන්තියේ අවසාන පරීක්ෂණය

| | |
|---|---|
| 750 | අමරසිංහ, ඒ. ආර්. |
| 1231 | රුද්‍රිගු, වී. සී. එච්. |
| 711 | ද සිල්වා, අයි. පී. ඇස්. |
| 591 | රණතුංග, ආර්. ඒ. ඇස්. |
| 808 | පෙරේරා, එච්. එච්. කේ. |
| 1176 | පෙරේරා, ඇම්. කේ. |
| 605 | පෙරේරා, ඩබ්ලිව්. පී. |

උතුරු ඉන්දීය සංගීතය පිළිබඳ හයඅවුරුදු (වාදනය) පන්තියේ අවසාන පරීක්ෂණය

| | |
|---|---|
| 750 | අමරසිංහ, ඒ. ආර්.. |

උතුරු ඉන්දීය සංගීතය පිළිබඳ හයඅවුරුදු (වාදනය) පන්තියේ මධ්‍යම පරීක්ෂණය

| | | |
|---|---|---|
| 2344 | හෙට්ටිආරච්චි, ඩී. ඒ. | (වයලින්) |
| 2333 | ජයවර්ධන, ඒ. ඩී. | ,, |
| 2292 | වණිගසේකර, ඇල්. ආර්. | ,, |
| 1553 | සෙනෙවිරත්න, කේ. | ,, |
| 1668 | ජිනසේන, ඇම්. එච්. | ,, |
| 1692 | සිරිසේන, කේ. ඒ. | ,, |
| 630 | ජයරත්න, කේ. ඇල්. පී. | ,, |
| 1561 | ප්‍රනාන්දු, ටී. ඇම්. | ,, |
| 2372 | සමරවීර, ඩබ්ලිව්. ඩී. ඩබ්ලිව්. | ,, |
| 2178 | මිලිනෝනා, කේ. ඇල්. | ,, |
| 695 | විද්‍යාරත්න එච්. ඇල්. ඇම්. | (එස්රාජ්) |
| 2413 | ජිනදාස, කේ. ඩී. | ,, |
| 1706 | පෙරේරා, ජී. සී. | (බටනලා) |
| 1843 | ජයවර්ධන, ඩී. එච්. | (තබ්ලා) |
| 2293 | චන්ද්‍රසේන, ටී. ඇම්. ඩී. | ,, |
| 2333 | ජයවර්ධන, ඒ. ඩී. | ,, |
| 2371 | විජේසිංහ, වී. ජී. | ,, |
| 2345 | සිරිසේන, පී. කේ. | ,, |
| 2379 | පෙරේරා, ඇල්. ඒ. එච්. කේ. | ,, |
| 2311 | පෙරේරා, ඇස්. ජී. | (සිතාර්) |
| 808 | පෙරේරා, කේ. | ,, |
| 606 | සුනිල් රෙජිනෝල්ඩ්, ආර්. බී. | ,, |
| 2379 | පෙරේරා, කේ. ඇල්. ඒ. එච්. | ,, |
| 2316 | සෝමසිරි, කේ. යූ. | ,, |
| 2237 | හේවාදේවගේ, ඇස්. | ,, |

උඩරට නාට්‍යකලාව පිළිබඳ හය අවුරුදු පන්තියේ මධ්‍යම පරීක්ෂණය

| | |
|---|---|
| 2208 | ජයවීර, ටී. |
| 2452 | බන්දුගේ, ඇම්. ආර්. |
| 2552 | රණසිලි, පී. වී. ඒ. ඩී. |
| 2074 | පෙරේරා, වී. ඒ. සී. |
| 2682 | රාමනායක, ඇල්. |
| 2707 | පේරුසිංහ, පී. |
| 805 | දයාරත්න, ටී. කේ. (1 වැනි පෙල) |

උඩරට නාට්‍යකලාව පිළිබඳ හය අවුරුදු පන්තියේ අවසාන පරීක්ෂණය

| | |
|---|---|
| 892 | හේමලතා, ඩී. ඩී. ඇම්. |
| 820 | ජයන්ති, ජේ. එච්. |
| 949 | පේරුසිංහ, පී. කේ. |
| 886 | ගුණතිලක, යූ. ආර්. (1 වැනි පෙල) |
| 895 | අල්විස්, ඇස්. ඇම්. |
| 1149 | විජේවර්ධන, ඒ. ඇස්. එච්. ඩී. (1 වැනි පෙල) |

## රජයේ ලලිත කලායතනය

1960 මාර්තු මස පැවැත් වූ රජයේ ලලිත කලායතනයේ ඇඳීම හා පින්තාරු කිරීම පිළිබඳ උසස් පන්තියේ අවසාන පරීක්ෂණය (චිත්‍රකම් ගුරුවරුන් කායයීනෝම්නා කඩඉමෙන් උසස් කිරීම සඳහා පෙනී සිටිය යුතු පරීක්ෂණය)

යථෝක්ත පරීක්ෂණයෙන් සාමාර්ථය ලත් චිත්‍රකර්ම ගුරුවරුන්ගේ නාම ලේඛනය

| විභාග අංකය | | නම |
|---|---|---|
| පීසීඇස් | 15 | ජී. ඒ. ඇස්. ගුණතිලක |
| පීසීජී | 24 | ඇස්. සිවප්‍රගාසම් |
| පීසීජී | 42 | කේ. ඕ. පී. ජයවර්ධන |
| පීසීඇස් | 45 | ඇන්. ධර්මදාස |
| පීසීඇස් | 50 | එච්. එච්. පී. පී. ප්‍රනාන්දු |
| පීසීඇස් | 61 | ජී. ජී. ටී. ජයවීර |
| පීසීඇස් | 62 | ඇස්. වික්‍රමසූරිය |
| පීසීජී | 71 | ඇස්. ජයවර්ධන |
| පීසීජී | 92 | කේ. බටගොඩ |
| පීසීජී | 102 | ජී. ඇල්., බී. කරුණාරත්න |
| පීසීජී | 104 | ඇම්. ඇස්. පින්තු |
| පීසීඇස් | 113 | එච්. ඇස්. ඩී. ද සිල්වා |
| පීසීඇස් | 115 | ආර්. ධනපාල |

උසස් සාමාර්ථය ලත් චිත්‍රකම් ගුරුවරුන්ගේ නම් හා අසමත් වූ විෂයයන්

| | | |
|---|---|---|
| පීසීඇස් | 33 | පී. කුමාරසිංහ (චිත්‍ර සම්පිණ්ඩනය). |
| පීසීජී | 103 | ඇම්. ඩී. ඩබ්ලිව්. සමරතුංග (පින්තාරු කිරීම) |

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ :—

| සේවය | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. ගෝනි නූල් | 60.6.28 |
| 2. ගිනි නිවන යන්ත්‍ර (Fire Extinguishers) | 60.7.5 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

යූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූනි 3 වැනි දින,
කොළඹදීය.

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින්—තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1— ලියුම් කවර සැපයීම සඳහා 1960 සැප්තැම්බර් 6 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍රිකා භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩරකරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100/-ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 සැප්තැම්බර් 5 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝරම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර කරුවන් සඳහා විශෙෂ ටෙන්ඩර ෆෝරම සකස් කර තිබේ. රු.100/-ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී ෆෝරම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර ෆෝරම කොළද යි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූනි මස 3 වැනිදා,
කොළඹ දී ය.

## යුද්ධ හමුදා මූලස්ථානය

1960 ක්වූ ඔක්තෝබර මස 1 වෙනි දින සිට 1961 ක්වූ සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලසීමාවට පමණයි.

ලංකා යුද්ධ හමුදාවේ පහත දක්වන සේවා සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ක්වූ ජූනි මස 24 වෙනි සිකුරාදා උදය 9.30 වන තුරු භාර ගනු ලැබේ :—

1. කොළඹ, පනාගොඩ, දියතලාව, මන්නාරම, තිරිකුනාමලේ, අම්පාරේ, සහ රිදියාගම යන ස්ථානවලට, මස් වගී, අළුත් මාලු, කිරි, බිත්තර සහ බටර්, කරවල සහ එළවළු යනාදිය සැපයීම.

2. ඉහතකී සියළුම ස්ථානවල බැරැක්ක සහ ආරෝග්‍ය ශාලාවල කිළුටු රෙදි සේදීමට සහ එකී ස්ථානවල සොල්දාදුවන්ගේ රෙදි සේදීම.

3. කොළඹ පමණක් පින්කෑම වර්ග යනාදිය සහ හාල් සිල්ලර සැපයීම.

4. කොළඹ සහ දියතලාව යන ස්ථානවල ගුදිරි සෑදීමට අවශ්‍ය පිදුරු සැපයීම.

5. දියතලාව යන ස්ථානයෙහි පමණක් කසල සෝදක සේවය සැපයීම.

6. දියතලාව, මන්නාරම, තිරිකුණාමලේ, අම්පාරේ සහ රිදියාගම යන ස්ථානවල පමණක් පාන් සැපයීම.

මේ සම්බන්ධව සම්පූර්ණ විස්තර කොළඹ ලෝවර් ලේක් පාරේ යුද්ධ හමුදා මූලස්ථානයෙන් ලබාගත හැක.

ජී. ආර්. ජයසිංහ,
යුද්ධ හමුදා අණදෙන නිලධාරිතුමා වෙනුවට.

1960 ක්වූ මැයි මස 28 වෙනි දින දීය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් සබරගමු පලාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ අංක 2 දරණ ප්‍රවේශ මාර්ගයේ පැන්නුම් පාලම් 5 ක් තැනීම සඳහා 1960 ජූනි මස 28 වෙනි අඟහරුවාදා පෙර වරු 11.30 වන තුරු ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර වල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවර වල බහා ඉදිරිපත් කළ යුතුයි. සැලැස්ම හා වැඩ පිළිබඳ විස්තර රත්න පුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැක.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 10,000 ට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වී ඇති රු. 25 ක් ටෙන්ඩර් සඳහා කච්චේරියේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවන්ට 60.6.3 වැනි දින සිට 60.6.24 වැනි දින දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත් කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරින්ගෙන් ලබා ගත් සහතිකයක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේ දි ඉදිරිපත් කළ යුතු යි.

කරුණු නොවිමසා එකක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ යම් ටෙන්ඩරයක යම් කොටසක් පිළිගැනීමේ හෝ අයිතිය රජය සතුයි.

සී. කණගසුන්දරම්,
රත්නපුර උප කොටස භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1. පොලොන්නරුවේ ඊශාන දිසාව භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් කවුඩුල්ල උප කොට්ඨාශයේ රොටවැව ඕවර්සියර් නිවාසයක් සෑදීම සඳහා 1960 ජූනි මස 15 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. හිඟුරක්ගොඩ වාරිමාර්ග කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර වල පිළියෙල කරන ලද ටෙන්ඩර් ඊත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 18,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වී ඇති රුපියල් 25ක් කච්චේරියේ හෝ මෙම කාර්යාලයේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවන්ට 1960 ජූනි මස 6 වැනි දින සිට 11 වැනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත් කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතික පත්‍ර ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටීමට කැමති කොන්ත්‍රාත් කරුවන්ට 1960 ජූනි මස 15 වැනි දින 9.30ට ඊශාන දිශාව භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කාර්යාලයට පැමිණිය යුතුයි.

ඕ. ඒ. ගුණවර්ධන,
උප වාරිමාර්ග ඉංජිනේරු තැන.
කවුඩුල්ල උප කොට්ඨාශය.

1960 මැයි මස 23 වැනි දින,
හිඟුරක්ගොඩ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1. පොළොන්නරුවේ ඊශාන දිසාව භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් කවුඩුල්ල උප කොට්ඨාශයේ මින්නේරියේ ඕවර්සියර් නිවාසයක් සෑදීම සඳහා 1960 ජූනි මස 15 වැනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. හිඟුරක්ගොඩ වාරිමාර්ග කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර වල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 18,000කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වී ඇති රුපියල් 25ක් කච්චේරියේ හෝ මෙම කාර්යාලයේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත්කරුවන්ට 1960 ජූනි මස 6 වැනි දින සිට 11 වැනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත් කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතික පත්‍ර ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටීමට කැමති කොන්ත්‍රාත් කරුවන් 1960 ජූනි මස 15 වැනි දින පෙරවරු 9.30ට දිශාව භාර ප්‍රදේශිය වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කාර්යාලයට පැමිණිය යුතුයි.

ඕ. ඒ. ගුණවර්ධන,
උප වාරිමාර්ග ඉංජිනේරු තැන,
කවුඩුල්ල උප කොට්ඨාශය.

1960 මැයි මස 23 වැනි දින,
හිඟුරක්ගොඩ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර ප්‍රාශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මොණරාගල වාරිමාර්ග උප කොට්ඨාශයේ ඇතිමෝල වැවේ ප්‍රධාන කැඩුම්කඩයේ 7 වැනි දන්වැල නො. 1 පිරවීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 22.6.60 වෙනිදින පෙරවරු 10 වනතෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සමන්විත විය යුතුයි. අවශ්‍ය ෆෝරම මොණරාගල උප කොට්ඨාශ භාර වාරිමාර්ග නිලධාරි තැනගෙන් ලබාගත හැක. තවත් වැඩි විස්තර ආදියද ඔහුගෙන්ම ලබාගත හැකි අතර මේ සඳහා ඇති සැලසුම් ඔහුගේ කාර්යාලයේදි පරීක්ෂාකළ හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 26,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන් බව ඔප්පුකල හැකි හා කච්චේරියක හෝ වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කිරීමෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල අයවළුන්ට පමණක් 21.6.60 වෙනි දිනතෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරණු ලැබේ.

ඕ. ඇස්. චන්ද්‍රරත්න,
උ. කො. භා. වා. මා. නිලධාරි තැන,
මොණරාගල උ. කො.

කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කායඹිලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය :** මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම :** ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය :** ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර් කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන්ද සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතීනම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිලගණන් වලංගු කාල සීමාව :** ටෙන්ඩරකරුන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත් කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. **තැන්පත් ඇප මුදල් :** තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම :** තෝරාගත් ටෙන්ඩර් කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුල ඉඩ කඩ සලසාදෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි :** ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේ ය.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
මුදල් අංශය,
ගාලු මුවදෙර,
මහලේකම් කාර්යාලය,
කොළඹ, 30. 5. 1960.

## උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය සහ වේලාව | ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් | | | | | | | | | |
| | | | | සේවකයන්ට | | | | නොගෙවන රෝගීන්ට | | | | | |
| | | | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු | කිරි ආහාර | අඩුකිරි ආහාර |
| | රු. | රු. | | | | | | | | | | | |
| **කුරුණෑගල කොට්ඨාශය :** | | | | | | | | | | | | | |
| අලව්ව ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 800 | | 400... | 400... | 400... | 1,600... | 2,050... | 1,950... | 1,900... | 8,150... | — ... | — |
| අබන්පොල මාතෘ නිවාසය | 100... | 300 | | 200... | — ... | 350... | 700... | 600... | — ... | 1,050... | 2,250... | — ... | — |
| බින්ගිරිය ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 400 | | 150... | 150... | 150... | 550... | 350... | 300... | 250... | 1,250... | — ... | — |
| බෝවත්ත මාතෘ නිවාසය | 100... | 400 | | 50... | — ... | 50... | 150... | 500... | — ... | 900... | 2,000... | — ... | — |
| දූනකදෙනිය මාතෘ නිවාසය ... | 100... | 300 | | 300... | 100... | 150... | 500... | 350... | 150... | 150... | 550... | — ... | — |
| ඇහැතුවැව මාතෘ නිවාසය | 100... | 400 | | 150... | — ... | 300... | 650... | 400... | — ... | 800... | 1,700... | — ... | — |
| ගොකැරැල්ල ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 600 | | 150... | 150... | 150... | 450... | 1,750... | 1,700... | 1,750... | 7,000... | 200... | — |
| ගෝනිගොඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 600 | | 100... | 100... | 100... | 350... | 700... | 700... | 600... | 2,550... | — ... | — |
| හෙට්ටිපොළ ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 400 | | 200... | 200... | 200... | 850... | 1,700... | 1,500... | 1,700... | 6,350... | — ... | — |
| හිරිපිටිය ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 600 | 8.7.60 පෙ.ව. 10ට | 200... | 150... | 150... | 700... | 800... | 850... | 850... | 3,300... | — ... | — |
| කඳානගෙදර ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 800 | | 600... | 550... | 550... | 2,200... | 1,200... | 1,050... | 1,150... | 4,450... | — ... | — |
| කටුපොත ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 800 | | 300... | 300... | 350... | 1,150... | 850... | 850... | 950... | 3,550... | — ... | — |
| කොබෙයිගන මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | 100... | 150... | 550... | 300... | — ... | 550... | 1,100... | — ... | — |
| කොස්හේන මාතෘ නිවාසය ... | 100... | 300 | | 200... | 200... | 200... | 800... | 150... | 150... | 150... | 650... | — ... | — |
| මඩහපොළ මාතෘ නිවාසය | 100... | 300 | | 200... | — ... | 400... | 800... | 550... | — ... | 500... | 750... | — ... | — |
| මහනන්නේරිය මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | — ... | 350... | 650... | 250... | — ... | 550... | 1,150... | — ... | — |
| මාහෝ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 800 | | 250... | 250... | 250... | 900... | 1,900... | 1,750... | 1,950... | 7,700... | — ... | — |
| මාවතගම ආරෝග්‍ය ශාලාව ... | 100... | 800 | | 250... | 200... | 250... | 1,000... | 1,900... | 1,750... | 2,000... | 7,850... | — ... | — |

## උපලේඛනය (සම්බන්ධයි)

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා කැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය සහ වේලාව | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයන්ට: මාළු | මස් | කරවල | එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | මස් | කරවල | එළවළු | කිරි ආහාර | අඩු කිරි ආහාර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මූකලන්යාය මාතෘ නිවාසය ... | 100... | 300 | | 200... | 200... | 200... | 800... | 750... | 600... | 650... | 2,700... | — ... | — |
| මූනමල්දෙනිය මාතෘ නිවාසය ... | 100... | 300 | | 300... | 300... | 300... | 1,200... | 250... | 200... | 200... | 850... | — ... | — |
| මුරුතන්ග මාතෘ නිවාසය | 100... | 300 | | 200... | 200... | 200... | 850... | 50... | 50... | 50... | 150... | — ... | — |
| මුවන්හැල ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 600 | | 450... | 450... | 400... | 1,750... | 800... | 700... | 750... | 3,000... | 900... | — |
| නාරම්මල ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 600 | | 300... | 300... | 300... | 1,200... | 450... | 500... | 500... | 2,050... | — ... | — |
| නිකාවැව ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 600 | 8.7.60 පෙ.ව. 10ට | 150... | 100... | 100... | 500... | 700... | 400... | 650... | 2,800... | — ... | — |
| පොල්පිටිගම ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 600 | | 550... | 600... | 550... | 2,250... | 1,450... | 1,400... | 1,450... | 5,650... | — ... | — |
| පොල්ගහවෙල ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 600 | | 250... | 250... | 250... | 1,000... | 1,100... | 1,100... | 1,100... | 4.450... | — ... | — |
| රිදීගම ආරෝග්‍යශාලාව | 100... | 1,000 | | 550... | 550... | 550... | 2,200... | 2,800... | 2,950... | 2,750... | 11,100... | 1,050... | 1,300 |
| සඳලංකාව මාතෘ නිවාසය ... | 100... | 300 | | 300... | 250... | 300... | 1,200... | 150... | 150... | 100... | 500... | — ... | — |
| තලන්පිටිය ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 600 | | 250... | 250... | 250... | 1,000... | 1,550... | 1,500... | 1,350... | 5,950... | — ... | — |
| තඹරන්බුව මාතෘ නිවාසය ... | 100... | 300 | | 20... | — ... | 20... | 50... | 200... | — ... | 450... | 950... | — ... | — |
| **මාතලේ කොට්ඨාශය :** | | | | | | | | | | | | | |
| අතන්කඩවල මාතෘ නිවාසය ... | 100... | 300 | | 550... | — ... | 550... | 800... | 800... | — ... | 800... | 1,150... | 200... | — |
| බී.ඕ.පී. 400 පොළොන්නරුව ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව ... | 100... | 400 | | 350... | — ... | 750... | 1,350... | 450... | — ... | 950... | 1,950... | — ... | — |
| දීවිල්ල මාතෘ නිවාසය ... | 100... | 300 | | 250... | — ... | 550... | 1,050... | 550... | — ... | 1,200... | 2,400... | — ... | — |
| ගලේවල ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 800 | | 1,050... | — ... | 550... | 2,150... | 4,000... | — ... | 1,950... | 8,000... | 4,900... | — |
| හිඟුරක්ගොඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 800 | | 750... | 750... | 700... | 2,950... | 1,850... | 1,800... | 1,800... | 7,300... | — ... | — |
| කෝන්ගහවෙල මාතෘ නිවාසය ... | 100... | 600 | 12.7.60 පෙ.ව. 10ට | 250... | 250... | 250... | 1,150... | 900... | 900... | 950... | 3,700... | — ... | — |
| මඩිපොළ අරෝග්‍ය ශාලාව ... | 100... | 800 | | 350... | 350... | 350... | 1,400... | 900... | 1,000... | 900... | 3,850... | — ... | — |
| මනම්පිටිය මාතෘ නිවාසය ... | 100... | 300 | | 250... | — ... | 250... | 1,300... | 300... | — ... | 250... | 1,450... | — ... | — |
| නාලන්ද ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 600 | | 350... | 400... | 350... | 1,400... | 1,150... | 1,200... | 1,150... | 4,800... | — ... | — |
| උතුරු මාතලේ මාතෘ නිවාසය ... | 100... | 400 | | 300... | 300... | 600... | 950... | 600... | 600... | 1,300... | 1,900... | — ... | — |
| ඕවිලකන්ද මාතෘ නිවාසය | 100... | 400 | | 350... | — ... | 650... | 1,350... | 350... | — ... | 550... | 1,300... | — ... | — |
| රත්තොට ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 600 | | 250... | 200... | 200... | 850... | 900... | 850... | 850... | 3,500... | — ... | — |
| **කෑගල්ල කොට්ඨාශය:** | | | | | | | | | | | | | |
| අල්ගම මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | 150... | 150... | 450... | 300... | 300... | 350... | 1,150... | — ... | — |
| බුලත්කොහුපිටිය මාතෘ නිවාසය ... | 100... | 400 | | 50... | 200... | 300... | 800... | 100... | 450... | 850... | 2,300... | — ... | — |
| දෙරනියගල ආරෝග්‍ය ශාලාව ... | 100... | 800 | | 200... | — ... | 350... | 700... | 1,450... | — ... | 2,900... | 5,850... | — ... | — |
| හේමත්තගම ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 400 | 14.7.60 පෙ.ව. 10ට | 300... | 300... | 250... | 1,100... | 900... | 850... | 850... | 3,450... | — ... | — |
| හෙට්ටිමුල්ල ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 400 | | 100... | 150... | 400... | 800... | 300... | 350... | 1,200... | 2,450... | — ... | — |
| හිඟුරලකන්ද මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | 150... | 300... | 600... | 50... | 50... | 50... | 100... | — ... | — |
| කන්දපිටපත්තු මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | — ... | 150... | 650... | 300... | — ... | 250... | 850... | — ... | — |

## උපලේඛනය (සම්බන්ධයි)

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය සහ වේලාව | ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයන්ට — මාළු | මස් | කරවල | එළවළු | නොගෙවන රෝගීන්ට — මාළු | මස් | කරවල | එළවළු | කිරි ආහාර | අඩු කිරි ආහාර |
| | රු. | රු. | | | | | | | | | | | |
| මහපල්ලෙගම ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 400 | | 200... | 200... | 200... | 700... | 700... | 750... | 850... | 3,050... | — ... | — |
| මකුදෙල මාතෘ නිවාසය... | 100... | 300 | | — ... | 100... | 200... | 550... | — ... | 300... | 850... | 1,900... | — ... | — |
| මාවනැල්ල ග්‍රාමීය ආරෝග්‍යශාලා ... | 100... | 600 | 14.7.60 පෙ.ව. 10ට | 200... | 150... | 200... | 600... | 1,850... | 1,800... | 1,900... | 7,350... | — ... | — |
| රඹුක්කන ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 600 | | 150... | 150... | 150... | 450... | 1,800... | 1,800... | 1,850... | 7,350... | — ... | — |
| වරකපොල ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 800 | | 400... | 450... | 450... | 1,650... | 2,050... | 2,100... | 1,950... | 10,900... | 2,750... | — |
| වැලිගමුව මාතෘ නිවාසය | 100... | 300 | | 100... | 100... | 100... | 300... | 150... | 150... | 150... | 500... | — ... | — |
| **යාපන කොට්ඨාශය :** | | | | | | | | | | | | | |
| අලවෙට්ටි මාතෘ නිවාසය... | 100... | 300 | | 150... | — ... | 300... | 650... | 50... | — ... | 100... | 150... | — ... | — |
| අම්පන් මාතෘ නිවාසය ... | 100... | 300 | | 500... | — ... | 200... | 950... | 600... | — ... | 300... | 1,250... | — ... | — |
| අනලතිව් මාතෘ නිවාසය | 100... | 300 | | 150... | — ... | 300... | 650... | 450... | — ... | 800... | 1,700... | — ... | — |
| අච්චු වේලු ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 400 | | 400... | — ... | 850... | 1,650... | 400... | — ... | 900... | 1,900... | — ... | — |
| වෙම්පියන්පත්තු ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 600 | | 800... | — ... | 850... | 1,350... | 750... | — ... | 800... | 1,250... | — ... | — |
| චන්කානෙයි ග්‍රාමීය රෝහල සහ මාතෘ නිවාසය ... | 100... | 600 | | 1,300... | — ... | — ... | 1,750... | 1,400... | — ... | — ... | 1,950... | — ... | — |
| ඩෙල්ෆ්ට් ආරෝග්‍යශාලාව | 100... | 800 | | 300... | — ... | 600... | 1,200... | 500... | — ... | 1,000... | 1,950... | — ... | — |
| කරෙයිනාගර් මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | — ... | 300... | 600... | — ... | — ... | — ... | 50... | — ... | — |
| කරවටි මාතෘ නිවාසය ... | 100... | 200 | 26.7.60 | 300... | — ... | 350... | 500... | 50... | — ... | 50... | 50... | — ... | — |
| කෝපායි ග්‍රාමීය රෝහල සහ මාතෘ නිවාසය ... | 100... | 400 | පෙ.ව. 10ට | 250... | — ... | 550... | 1,100... | 700... | — ... | 1,450... | 1,150... | — ... | — |
| කොඩිකාමම් මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | — ... | 200... | 450... | 50... | — ... | 100... | 300... | — ... | — |
| මන්ඩතිව් මාතෘ නිවාසය | 100... | 300 | | 150... | — ... | 300... | 600... | 150... | — ... | — ... | 600... | — ... | — |
| නයිනතිව් මාතෘ නිවාසය | 100... | 300 | | 450... | — ... | — ... | 600... | 500... | — ... | — ... | 600... | — ... | — |
| නවාල මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | — ... | 300... | 600... | 100... | — ... | 150... | 350... | — ... | — |
| පල්ලේ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 600 | | 400... | — ... | 850... | 1,700... | 600... | — ... | 1,050... | 2,150... | — ... | — |
| පල්ලේතිරුප්පු ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100... | 400 | | 250... | — ... | 350... | 950... | 450... | — ... | 700... | 1,800... | — ... | — |
| පේදුරු තුඩුව මාතෘ නිවාසය ... | 100... | 300 | | 300... | — ... | 150... | 650... | 50... | — ... | 50... | 950... | — ... | — |
| පූනාකරි ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව සහ මාතෘ නිවාසය ... | 100... | 600 | | 400... | — ... | 450... | 2,150... | 500... | — ... | 500... | 2,600... | — ... | — |
| පුන්ගුඩතිව් ආරෝග්‍ය ශාලාව ... | 100... | 600 | | 1,650... | — ... | — ... | 2,200... | 2,200... | — ... | — ... | 3,000... | — ... | — |
| වඩුකඩයි ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව ... | 100... | 400 | | 200... | — ... | 450... | 900... | 300... | — ... | 700... | 1,400... | — ... | — |
| වෙලානෙයි මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | — ... | 200... | 450... | 50... | — ... | 100... | 150... | — ... | — |
| වේරාවිල් මාතෘ නිවාසය | 100... | 300 | | 150... | — ... | 300... | 600... | 150... | — ... | 350... | 700... | — ... | — |

---

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**රාගම මහර බන්ධනාගාරයෙහි හිස් ගෝනි, ලනුමලු ආදිය මිල දී ගැනීම**

පහත සඳහන් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් 1960 ජූනි මස 22 දින උදේ 9.30 දක්වා මහර බන්ධනාගාර අධිකාරී තැන විසින් භාරගනු ලැබේ :—

| | | |
|---|---|---|
| හිස් තුනී ගෝනි | ... | 300 |
| හිස් ඝණකම ගෝනි | ... | 265 |
| හිස් ලනුමලු (ලුනු) | ... | 5 |
| හිස් රාත්තල් 1 සී. සී. ඇල්. ටින් | ... | 57 |
| හිස් රාත්තල් 4 බේකරිකොම්පවුන්ඩ් ටින් | | 10 |

2. ටෙන්ඩර් සඳහා රුපියල් 10 ක මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. එයට ලබාගන්නා රිසිට් පත ටෙන්ඩර් පත්‍රය සමග අමුනා එවිය යුතුයි. තමාගේ ටෙන්ඩරය භාරගත් බව ලිපියකින් දන්වන ලදුව දින 7ක් ඇතුළත නියම මිලගණන් ගෙවා ඉහත සඳහන් බඩු ගෙනයාමට නොහැකිවන හෝ අකමැත්ත දක්වන අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල රජය සතු කරනු ලැබේ. ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ටෙන්ඩර්කරු විසින් දී තිබෙන ලිපියකට තැපැල් කළහොත් හෝ ගෙන විත් දුන හොත් එය ඔහුට ලැබුණු බවට සලකනු ලැබේ. භාරගත් ටෙන්ඩර්කරු විසින් ඒ බඩු ගෙනයාමෙන් පසුව ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර්කරු විසින් ගෝනිය, ටින් එක, යනාදී වශයෙන් මිල ගණන් වෙන වෙනම සඳහන් කළ යුතුයි. "හිස් ගෝනි මිලදී ගැනීම, සඳහා ටෙන්ඩර්" යනුවෙන් කවරයේ වම් කෙළවරේ මුදුනේ සඳහන් සීල් තබන ලද ටෙන්ඩර් පහත සඳහන් අයට එවිය යුතුයි. මේ සඳහා මුද්‍රිත පෝර්ම නැත.

4. මහර බන්ධනාගාර අධිකාරී තුමාගේ කාර්යාලයේ දී 1960 ජූනි මස 22 දින උදේ 10 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවනට ඒ අවස්ථාවේදී පැමිණ සිටීමට පුළුවන.

5. මේ සඳහා දැනගත යුතු තවත් විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

ඊ. ඇල්. ප්‍රනාන්දු,
මහර බන්ධනාගාර අධිකාරී තැන.

මහර බන්ධනාගාරය,
රාගම, 24. 5. 1960.

---

## මීගමුවේ තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට 1959-60 ආදායම් වර්‍ෂයේ ඉතිරි කොටස . තුළ මූස්න තැනීමට යෝග්‍ය මිටි සැපයීම

1959-60 ආදායම් වර්‍ෂයේ ඉතිරි කාලය තුළ මීගමුවේ තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට මූස්න තැනීමට යෝග්‍ය මිටි සැපයීම සඳහා මෙහි පහත අත්සන් කරන අය විසින් 1960 ජූනි මස 14 වැනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සඳහා රුපියල් 25 ක මුදලක් තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ අධිකාරි තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් මුද්‍රණය කරන ලද ටෙන්ඩර් පෝර්ම පහත අත්සන් කරන අයගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර් කරුවන් විසින් විශෙෂයෙන් සැලකිය යුක්තක් නම් තමා නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරින් හා ඉලක්කමෙන් දක්වීමයි. එසේ අකුරින් හා ඉලක්කමෙන් සඳහන් නොවූ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්‍ෂෙප කිරීමට ඉඩ තිබේ.

1960 ජූනි මස 14 වැනි දින පෙරවරු 9.35 ට පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එකී වේලාවේදී කැමති ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවීමට නොසතුටු ටෙන්ඩර් කරුවන් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් මඟින්, පිටත මුද්‍රා සහිත නම, ලිපිනය සහ සේවයද සඳහන් කොට ටෙන්ඩර් පත්‍ර පෙඩ්ගලිකවම ඒ සඳහා බලය ලත් නිලධාරියෙකුට භාර දීමෙන් කුවිතාන්සියක් ලබාගත හැක.

වැඩි විස්තර පහත සඳහන් අයගෙන් ලබා ගත යුතුයි.

ඊ. ඒ. ඇස්. ඩබ්ලිව්. පෙරේරා,
තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ අධිකාරි.

1960 ජූනි මස 3 වෙනි දින,
මීගමුව.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කෑගල්ලේ 3 එම් වර්ගයේ ගෙවල් 6ක් සහ ජල සම්පාදන ක්‍රමයක් තැනීම

කෑගල්ලේ 3 එම් වර්ගයේ ගෙවල් 6ක් සහ ජල සම්පාදන ක්‍රමයක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 ජූලි මස 8 වෙනි සිකුරාදා පෙරවරු 10 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 90,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 90ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 ජූලි මස 6 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.
1960 මැයි මස 27 වෙනි දින.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්‍ෂ 1960 ජූනි මස 24 වෙනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ:—

| පාසැලේ නම | කළයුතු වැඩය |
| --- | --- |
| නු/දීගලහින්න සි. මි. පා. ... | පාසැල් ගොඩනගිලි ආදිය |

සංලක්‍ෂ්‍යය : නු=නුවරඑළිය.

2. ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත්කරුවන් රු. 20,000/-ට නොඅඩු ගණනකට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 10,000/-ට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවී සිටිය යුතුයි.

3. තවද, අනුමත කරන ලද සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමූපකාර සමිතිද ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් එකී සමිති අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවී සිටීම හෝ රු. 20,000/-ට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ කිරීමේ හැකියාවක් තිබෙන බවට සහතික කරන ලද ලියකියවිලි, සමූපකාර සමිති සඳහා නම් සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්තුමාගෙන් ද, ග්‍රාමසංවර්ධන සමිති සඳහා නම් ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතුමාගෙන් ද, කම්කරු සමූපකාර සමිති සඳහා නම් කම්කරු කොමසාරිස්තුමාගෙන් ද ලබාගෙන මධ්‍යම පළාතේ අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කිරීම අවශ්‍යය.

4. වර්‍ෂ 1960 ජූනි මස 23 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර අපෙක්‍ෂකයින් විසින් අධ්‍යාපන අධ්‍යක්‍ෂතුමාගේ කායඹාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එකී වැඩය වෙනුවෙන් රු. 100/-ක මුදලක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර අධ්‍යාපන නිලධාරිතැනට ඉදිරිපත් කළ යුතුය. චැක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වව්චර් කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත යුතුය. මුදල් තැන්පත් කිරීමේ වව්චර් නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන 2 වන හා 3 වන ඡෙදයෙහි සඳහන් වන මුදල් ප්‍රමාණයන් අනුව ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා සමිතිවලට පමණකි.

6. ඉහත සඳහන් 2 වන හා 3 වන ඡෙදයන්හි දැක්වෙන පරිදි මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමඟය. සියලුම විස්තර හා තොරතුරු මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකිය. සැලැස්මවල් ද එහිදී බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කායඹාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ බාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

7. වර්‍ෂ 1960 ජූනි මස 24 වෙනි සිකුරාදා පස්වරු 2.30ට කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6ට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්‍ෂාකර බැලිය හැක.

10. වැඩය භාර ගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්‍ෂවරයා විසින් අවසර දෙනු ලබන විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ

ගැනුම් යෝජනාකරුවන් කැමැති නම් ගැනුම් යෝජනා පත්‍ර විවෘත කරන වේලාවට ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ. 1960 ජූනි මස 30 වෙනි බ්‍රහස්පතින්දා පෙ. ව. 10 ට දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරි තැනගේ කාර්යාලයේදී එකී ගැනුම් යෝජනා පත්‍ර විවෘත කරනු ලැබේ.

තමන් විසින් ඉල්ලුම් කරනු ලබන සේවය, භාර ගැනීම සඳහා ගැනුම් යෝජනා පත්‍ර භාර ගැනීමේ අවසන් දිනයේ සිට සති තුනක් ගැනුම් යෝජනාකරුවන් බලාපොරොත්තුවෙන් සිටිය යුතුය.

වැඩි විස්තර වාණිජ අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරි තැන.

තැ. පෙ. 355,
කොළඹ, 1960 මැයි මස 30 වෙනිදා.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

මුද්‍රිත පෝරම සහ රෙජිස්ටර මුද්‍රණයකර සැපයීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5 කිරුළ පාරේ වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960 ජූනි 29 වෙනි ද වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනුපිටපතකින්ද යුක්තකොට එවිය යුතුයි. ඒ පෝරම කොළ බොරලැස්ගමුවේ වේරහැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් 1960 ජූනි 28 වෙනි ද වන අඟහරුවාදා දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ටෙන්ඩර පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන් අයට ටෙන්ඩර පෝරම දියහැක්කේ කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ප්‍රධාන ගිණුම් නිලධාරි කාර්යාලයෙහි රු. 50 ටෙන්ඩර මුදලක් තැන්පත්කොට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් වැඩි විස්තර දැනගත හැක.

ලංකා ගමනාගමන මණ්ඩලයේ,
ලේකම් තැන.

1960. 5. 30.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

බොරලැස්ගමුවේ වේරහැර මධ්‍යම වැඩපොළේ භූමිභාගයෙහි ජලය රඳවන ටැංකියක් තැනීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5 කිරුළ පාරේ 220 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960වේ ජූනි මස 29 වෙනි බදාදා පෙරවරු 10 වන තෙක් බාරගනු ලැබේ. බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) මහතාගෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝ නම් ජලය රඳවන ටැංකි සාර්ථක ලෙස සාදා නිමකරන ලද්දාවූද රු. 60,000 හෝ ඊට වැඩියෙන් වියදම් යන වැඩ කිරීමට ලියා පදිංචිවූද කොන්ත්‍රාත් කරුවෝ පමණකි. ඔවුන් විසින් නාම සහතික පත්‍ර ආදිය බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය නියෝජ්‍ය ප්‍රධාන සිවිල් ඉංජිනේරු මහතා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඒ මහතා විසින් ඒවා පිළිගත හොත් ඔවුන් විසින් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින "ලංගම" ප්‍රධාන ගිණුම් නිලධාරි වෙත රු. 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ යුතුයි.

මුදල් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කළ විට නියෝජ්‍ය ප්‍රධාන සිවිල් ඉංජිනේරු මහතා විසින් 1960වේ ජූනි මස 25 වෙනිදා වන සෙනසුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර ලිපි නිකුත් කරනු ලැබේ.

කොයි ටෙන්ඩර පත්‍රයත් ලියා එවිය යුත්තේ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් දෙන ටෙන්ඩර පෝරම කොළවලය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1960වේ මැයි මස 30 වෙනි දිනදීය.

---

## කලුතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

වර්ෂ 1960 ජූලි මස 6 වෙනිදා පෙරවරු 9.30 දක්වා පහත සඳහන් සුළු වාරිමාර්ග වැඩ සඳහා මේ කච්චේරියේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර මා විසින් බාරගනු ලැබේ :—

**කලුතර තොටමුණ**

(1) කිරිලිබැදිය—දුම්මල මෝදර ඇල සුද්ධ කිරීම සහ හැරීම.
(2) ඇටවර ඇල ප්‍රමාණකයක් (රෙගියුලේටර්) තැනීම—ජාවත්ත
(3) ඉළුක්වත්ත ඇල සුද්ධ කිරීම.

**රයිගම් කෝරලය**

(1) ගුන්ගමුව අමුණ තැනීම.
(2) අග්ගොන කුඹුරුයායට ජලය සැපයීමේ පහසුකම් සැලසීම—කුඹුකේ පත්තුව.
(3) තක්කඩුවාවල සුළු ජල ගැලීම් වැලැක්වීමේ බැම්ම අලුත්වැඩියා කිරීම—ගල්පාත.

**බටහිර පස්දුන් කෝරලය**

(1) කඩවත් ඇල අමුනේ ජලසම්පාදන ඇල හරහා ප්‍රමාණකයක් (රෙගියුලේටර්) තැනීම—පාන්තිය.
(2) කැටගොඩ දොල ප්‍රමාණකය (රෙගියුලේටර්) තැනීම—ඉද්දගොඩ.

**නැගෙනහිර පස්දුන් කෝරළය**

(1) පන්නිමුල්ල අමුණ තැනීම—ලත්පඳුර.
(2) හොරගොඩයාය ගංවතුර වැලැක්වීමේ බැම්ම තැනීම—මගුර.
(3) බෙල්ලන කිතුල්ගොඩ දෙපා ඇල සුද්ධ කිරීම සහ හැරීම.
(4) ගල්වල අමුණ තැනීම—කඹුරාවල.

2. එක් එක් වැඩය වෙනුවෙන් රු. 10 බැගින් මේ කච්චේරියේ තැන්පත් කිරීමෙන් මේ පිළිබඳ ආකෘති පත්‍ර 1960 ජූලි 5 වෙනි දින පස්වරු 3 දක්වා ලබාගැනීමට පුළුවන.

3. ටෙන්ඩර් පත්‍ර, ජූලි මස 6 වෙනි දින පෙරවරු 10 ට විවෘත කරන අවස්ථාවේදී ඉල්ලුම් කරුවන්ට පෙනී සිටීමට ඉඩ දෙනවා ඇත. මේ පිළිබඳ වැඩි විස්තර ආකෘති පත්‍ර නිකුත් කිරීම අවසන්. වන දින දක්වා මේ කච්චේරියෙන් විමසා දැනගත හැක.

කේ. බී. දිසානායක,
කලුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
ඒජන්ත වෙනුවට.

කච්චේරිය, කළුතර,
26.5.1960

---

## මහනුවර කච්චේරිය

### මහනුවර දිස්ත්‍රික්කයේ පාරවල් කැපීම සහ බංගලාවක් අළුත්වැඩියා කිරීම

පහත සඳහන් වැඩ සඳහා මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960. 6.27 වැනි දින පෙරවරු 9.30 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| කටයුත්ත | | පිහිටි ගම | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | ටෙන්ඩර් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| 1. ප්‍රවේශ පාරක් කැපීම | ... | දඹවෙල වත්ත | පාතහේවාහැට ... | 50 | 0 |
| 2. පාරක් කැපීම | ... | මීගම වත්ත | පාතදුම්බර ... | 25 | 0 |
| 3. පාරක් අළුත්වැඩියා කිරීම | | මීගම වත්ත | පාතදුම්බර ... | 25 | 0 |
| 4. බංගලාවක් අළුත්වැඩියා කිරීම | | මාඹය වත්ත | පාතහේවාහැට | 25 | 0 |

2. ටෙන්ඩර් පත්‍ර මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් ලබාගන්නා ලද පෝර්ම කොලවල පමණක්ම විය යුතුයි. පිළිගන්නා ලද පෝර්ම කොලවල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම පත් ලබාගන්නට ප්‍රථම එක එක වැඩය සඳහා ඉහත සඳහන් පළමුවෙනි ඡේදයේ සඳහන් ටෙන්ඩර් මුදල් මහනුවර කච්චේරියේ තැන්පත්කර ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම කච්චේරියෙන් ලබාගත හැක්කේ 1960.6.24 වැනි දින දහවල් 12 දක්වා පමණී.

4. ටෙන්ඩර් පිටපත් දෙක බැගින් මුද්‍රා තබන ලද කවරයක බහා ලියා පදිංචි කළ තැපැලෙන් මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත 1960.6.27 වැනි දින පෙරවරු 9.30ට ප්‍රථම ලැබෙන පරිද්දෙන් එවිය යුතුයි. එක කවරයක එවිය යුත්තේ එක කටයුත්තක් සඳහා ටෙන්ඩර් පමණී. තවද කවරයේ පිට පැත්තේ වම් කෙළවරේ ටෙන්ඩර් එවන ලද කටයුත්තේ "වැඩයේ" නාම පැහැදිළිව ලියා එවිය යුතුයි.

5. මෙම කාර්යය සම්බන්ධයෙන් වැඩි විස්තර මහනුවර කච්චේරියේ සංවර්ධන වැඩ පිළිබඳ අධිකාරි තැනගෙන් ලබාගත හැක.

6. ටෙන්ඩරයේ මුළු මුදල ටෙන්ඩර් පෝර්මයෙහි අකුරින් හා ඉලක්කමින් සඳහන් කළ යුතුයි. අකුරින් ලියන ලද මුදල ඉලක්කමින් ලියන ලද මුදලට වෙනස් වී ඇති හෝ මුළු මුදල අකුරින් සඳහන් කර නැති ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට අවකාශ තිබේ. ටෙන්ඩර් පත්‍රවල යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් ඇත්නම් ඒ සියල්ල ටෙන්ඩර්කරුගේ කොට අත්සනින් සහතික කළ යුතුයි.

7. ඉහත සඳහන් කොන්දේසිවලට යටත් නොවන ටෙන්ඩර් නිෂ්ප්‍රභ කරනු ලැබේ.

8. මීට පෙර වතාවල වැඩ පැහැර හැරියේ යයි ආණ්ඩුව විසින් සම්මත කරනු ලැබූ ටෙන්ඩර් කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු නොලැබේ.

9. සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කිරීමේ බලයත්, යම් ටෙන්ඩරයක කොටසක් පමණක් භාරගැනීමේ බලයත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත රඳා පවතී.

10. ටෙන්ඩර් වසන දින පටන් සති තුනක් ඇතුළත කාලයේ දී කිසිම ටෙන්ඩර් කරුවෙකුට ඔහුගේ ටෙන්ඩරය ආපසු ගැනීමට බල යක් නැත. යම් ටෙන්ඩර් කරුවෙක් එසේ කළහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජ සන්තක කර, වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඔහුගේ නමත් ඇතුළත් කිරීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට බලය තිබේ.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ඉහත කී කර්මාන්තය නිසියාකාර කරන ලෙස, මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා සමග ගිවිසුමකට නොහොත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය. තවද ඔහු විසින් ටෙන්ඩර් කරන ලද මුළු මුදලෙන් සියයට 5ක් ඇප වශයෙන් එකී ඒජන්තතුමා වෙත තැන්පත් කළ යුතුය.

12. මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් ලිය විල්ලකින් දන්වා දින 7 ක් ඇතුළත කාලයේ දී, ගිවිසුමකට හෝ කොන්ත්‍රාත්තුවකට අත්සන් නොතබන හෝ ඇප මුදල තැන්පත් නොකරන ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ. එසේ කරනු ලබන අයගේ ද නම්, වැඩ පැහැර හරින කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට බලය තිබේ. අන් සෑම ටෙන්ඩර් ඇප මුදලක්ම තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ගිවිසුමකට නොහොත් කොන්ත්‍රාත්තුවකට අත්සන් කළාසින් පසුව නිදහස් කරනු ලැබේ.

13. ටෙන්ඩර්කරු විසින් දෙන ලද අන්තිම ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් එවන හෝ, ලිපිනයට බෙදාදෙන සෑම ලිය කියවිල්ලක්ම ඔහු විසින් ලත් බවට ඒත්තු ගනු ලැබේ.

14. ටෙන්ඩර් වසන දින පෙරවරු 10 ට සියළුම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවකාශ දෙනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා සමග විධාන යොදාගෙන යම් ටෙන්ඩර් කරුවෙකුට ඔහුගේ ටෙන්ඩරයෙහි දෙවන පිටපත ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

15. ලියා පදිංචි කළ තැපැලෙන් ලැබෙන ටෙන්ඩර් ලත් බව, ටෙන්ඩර් විවෘත කරන දින දන්වනු ලැබේ. ලියා පදිංචි කළ තැපැලෙන් ටෙන්ඩර් එවීමට අකමැති ටෙන්ඩර් කරුවන් තමන්ගේ ටෙන්ඩර් පුද්ගලිකවම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට හෝ එතුමාගේ බලයලත් අන් නිලධාරියෙකුට භාරදිය යුතුයි. ඒ නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුට එවේලේම ඊට කුවිතාන්සියක් දෙනු ලැබේ. එසේ භාරගත් ටෙන්ඩරය එම නිලධාරි තැන විසින් සභාපති තැනගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලනු ලැබේ.

16. මෙම ටෙන්ඩරය සම්බන්ධ කොන්දේසි හෝ වෙනත් කරුණක් වෙනස් කිරීමට සිදුවුවහොත් එසේ වෙනස් කරනු ලබන්නේ ටෙන්ඩර් විවෘත කළාසින් පසුවය. එවැනි ක්‍රියා මාර්ග යක් ගැනීමට ප්‍රථම ටෙන්ඩර් මණ්ඩලය විසින් ටෙන්ඩර් කරුවන් සියළුදෙනාටම දැනුම් දෙනු ලැබේ. එවැනි වෙනස් කිරීමකට ප්‍රථම ඊට නියම අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තුමාගේ අවසරය ලබා ගැනීම අවශ්‍යය.

17. මෙම කොන්ත්‍රාත්තුවේ සෑම කර්මාන්තයක් සඳහාම කොන්ත්‍රාත්කරු විසින් ලාංකික කම්කරුවන්ම යෙදවිය යුතුයි. එසේම හැකිතරම් දුරට වැඩ කරන ප්‍රදේශයෙන්ම කම්කරුවන් වැඩට බඳවා ගත යුතුයි. විශේෂ අවස්ථාවකදී ඒජන්තතුමාගෙන් ගන්නා ලද ලියවිල්ලකින් ලත් අවසරය පිට ලාංකික නොවූ හෝ අන් පෙදෙසක කම්කරුවන් වැඩෙහි යෙදවිය හැක. එවැනි අවසර යක් නොමැතිව ලාංකික නොවූ හෝ අන් ප්‍රදේශයක කම්කරුවන් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවේ.

ජේ. ඇස්. ප්‍රනාන්දු,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1960 මැයි 28 වෙනි දින,
මහනුවර කච්චේරියේ දීය.

## හම්බන්තොට කච්චේරිය

### මහගල්වැව ගොවි ජනපදයට බීමට ජලය සැපයීම

1960 ජූනි මස 25 දින සිට 1960 සැප්තැම්බර් මස 30 දක්වා කාලය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහගල්වැව ගොවි ජන පදයට බීමට ජලය සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර ලොරි අයිතිකරුවන් ගෙන් 1960 ජූනි මස 20 සඳුදා දහවල් 12 දක්වා හම්බන්තොට වැඩ බලන දිසාපති තැන විසින් බාරගනු ලැබේ. එකී වේලාවෙන් පසු ටැන්ඩර් විවෘත කරනු ලැබේ. එලෙසම එකී වේලාවට ටැන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැක.

2. ටැන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා කවරයේ දකුණු පැත්තේ ඉහළ කෙළවරේ "මහගල්වැව ගොවි ජනපදයට බීමට ජලය සැප යීමට ටැන්ඩර්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු. එසේ නැතිනම් කච්චේරිය තිබෙන ටැන්ඩර් පෙට්ටියට දැමිය යුතුයි. තනි සැනපුමකට අයකරන ගාස්තුව පමණක් ටැන්ඩර් පත්‍රවල අකුරෙන් සහ ඉලක්කමෙන් ලිවිය යුතුයි.

3. ටැන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා හම්බන්තොට කච්චේරියේ හෝ වෙන කච්චේරියක ඒ වෙනුවෙන් රුපියල් 10 ක මුදලක් තැන් පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. 1960 ජූනි මස 18වෙනිදා දාවල් 12න් පසු ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

4. ටැන්ඩර් අනුව ජලය සැපයීමට තෝරා ගන්නා ටැන්ඩර්කරු විසින් දිසාපතිතැනගේ නියමයන් අනුව ජලය සැපයීම කළ යුතුයි. දිනපතාම ජලය සැපයීමට වුවමනා වේදැයි ස්ථිර වශයෙන් කීමට නොහැකිය. එමනිසා ජලය සැපයීමට වුවමනා කරන දින ගැන ඒ ඒ අවස්ථාවලදී දන්වනවා ඇත.

5. ජලය සැපයීමට තෝරාගන්නා ටැන්ඩර්කරු විසින් එක් ගමන කට අඩු වශයෙන් ගැලුම් 800ක් ගෙන යා යුතුයි. දිසාපති තැනගේ නියමයක් අනුව සතුටුදායක ලෙස ජලය සැපයීම පිණිස රුපියල් 500ක ඇප මුදලක් හම්බන්තොට කච්චේරියේ තැන්පත්කොට ජලය සැප යීම සඳහා ගිවිසුමකට බැඳිය යුතුයි. එසේ සතුටුදායක ලෙස ජලය සැපයීමට තෝරාගත් ටැන්ඩර්කරුට නොහැකි වුවහොත් ඇප මුදල රජය සතු වනවා ඇත.

6. තෝරාගත් ටැන්ඩර්කරු විසින් පිරිසිදු ගැල්වනයිස් ටැන්කි වල වතුර ගෙනයා යුතුයි. දනට දිසාපති තැන විසින් මේ සඳහා පාවිච්චි කරන ටැංකි තෝරාගත් ටැන්ඩර්කරුට වුවමනා කෙරේ නම් ඒ සඳහා මාස් පතා මුදලක් ගෙවිය යුතුයි. නමුත් දිසාපති තැන තෝරාගත් ටැන්ඩර්කරුට ජලය ගෙනයාම සඳහා ටැංකි සැපයීමට බැඳීමක් නැත. අම්බලන්තොට දනට ජලය ගෙන යන ස්ථානයෙන් හෝ වෙන යම්කිසි ස්ථානයකින් දිසාපති තැනගේ නියමයන් අනුව ජලය ගෙනයා යුතුවේ.

7. කිසිදු කරුණක් නොපෙන්වා ටැන්ඩර් පත්‍ර එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමට දිසාපති තැනට බලය තිබේ.

පී. සිවඥනම්,
වැඩ බලන දිසාපති, හම්බන්තොට.

1960 මැයි මස 24 දින හම්බන්තොට
කච්චේරියේ දීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ ඇන්ඩර්සන් පොල්ෆ් පිට්ටනියේ ආහාර නිෂ්පාදන දෙපාර්තමේන්තුවට සත් මහල් කාර්යාල ගොඩනැගිලි තුනකට සැලැස්මවල් පිළියෙල කර එම ගොඩනැගිලි සෑදීම සඳහා 1959 ඔක්තෝබර් 30 වෙනි දින අංක 11,929 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍ර යේ හා 1959 නොවැම්බර් 11 වෙනි අංක 11,959 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ටැන්ඩර් දැන්වීම් මෙයින් අවලංගු කරණු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 60. 5. 30.

---

## මහනුවර තැපැල් කාර්යාලයේ ටැලිපෝන් සේවිකාවන්ගේ වැසිකිළි අළුත්වැඩියා කිරීම

මහනුවර තැපැල් කාර්යාලයේ ටැලිපෝන් සේවිකාවන්ගේ වැසිකිළි අළුත්වැඩියා කිරීම සඳහා එවනු ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ජූනි මස 22 වෙනි බදාදා පෙරවරු 10.30 වනතෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ජූනි මස 17 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති., සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ
වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 60. 5. 30.

---

## කොස්ලන්ද මහා විද්‍යාලයට ජලය සැපයීම

කොස්ලන්ද මහා විද්‍යාලයට ජලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ජූනි මස 22 වෙනි බදාදා පෙරවරු 10.30 වනතෙක් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොස්ලන්ද ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට-පතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ජූනි මස 17 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති., සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ
වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 60. 5. 30.

## මඩකලපුවේ සුළු සේවකයින්ගේ නිවාස සහ ඒවාට ජලය සැපයීම

මඩකලපුවේ සුළු සේවකයින්ගේ නිවාස සහ ඒවාට ජලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ජූනි මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වනතෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙර වරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මඩකලපුවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ජූනි මස 17 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 25,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති., සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ
වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 60. 5. 30.

---

## මහනුවර අප්ලන්ඩ් වත්තේ නිවාස දෙකක් සෑදීම

මහනුවර අප්ලන්ඩ්ස් වත්තේ නිවාස දෙකක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ජූනි මස 29 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු (නිර්මාණ) තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ජූනි මස 17 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 68,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති., සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ජී. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 60. 5. 30.

---

## මුල්ලේරියාවේ නව මානසිකාබාධ ආරෝග්‍යශාලාවේ නිවාස සෑදීම

මුල්ලේරියාවේ නව මානසිකාබාධ ආරෝග්‍යශාලාවේ නිවාස සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ජූනි මස 29 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ජූනි මස 17 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 435,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති., සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ජී. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්‍යාලයේ දීය,
කොළඹ, 60. 5. 30.

---

# බඩු බාහිරාදිය විකිණීම

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි උපකරණ

ජාතික නිවාස දෙපාර්තමේන්තුවට අයත් මාලිගාවත්තේ හදිසි නිවාස යෝජනා ක්‍රමයේ කඩා දමන ලද නිවාස 12ක කබොක්, ඇස්බැස්ටෝස් තහඩු සහ අනිකුත් ලීදඬු ඇතුළු ගොඩනැගිලි උපකරණ තොගයක් 1960 ජූනි මස 17 වැනි සිකුරාදා පෙ. ව. 10.00 එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගැනුම්කරුවන් විසින් සම්පූර්ණ මුදල් එදිනම ගෙවිය යුතුය.

ඉහතකී උපකරණ කාර්යාල වේලාවේදී මාලිගාවත්ත නිවාස ක්‍රමයේ සේවයේ නියුතු ගොඩනැගිලි පරීක්ෂක මහතාගේ අවසරය ඇතිව පරීක්ෂා කර බැලිය හැක.

එච්. පී. රණතුංග
ජාතික නිවාස කොමසාරිස් තැන වෙනුවට.

1960.5.30 දින
කොළඹ 2,
ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ දීය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණිත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. **දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—**

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට | ... | | ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | | ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | | ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30ට **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. **දායක මුදල් :—**

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා | ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට | ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... | ... | 25 | |
| | තැපැල් ගාස්තුවත් සමග | ... | 31 | |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... | ... | 10 | |
| | තැපැල් ගාස්තුවත් සමග | ... | 14 | |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. **මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.